**#mediaethicsSL #SinhalaPress #lka #Divaina #Mawbima #July03**

ප්‍රවෘත්ති වාර්තාකරණයේදී කොන් කිරීමක්/වෙන් කොට සැලකීමක්/ අපහාසයක් නොවනා භාෂා භාවිතයක් තමන්ට අභිමත පරිදි යොදාගැනීමට පුවත්පතකට නිදහස තිබේ. එසේම ඇතැම් විටකදී භාෂා භාවිතය හරහා 'නිර්මාණශීලී වෙමින්' අදහසක්, යටි අදහසක් මතු කිරීමටද පුවත්පතකට පූර්ණ නිදහස තිබේ. ඒ බවත් එසේම පවසමින් ඇමතිනී විජයකලා විසින් කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් දිවයින සහ මවුබිම මගින් වාර්තා කොට ඇති අන්දම මෙසේ ඉදිරිපත් කරමු. මෙම සිරස්තල දෙක සලකා බැලීමේදී මවුබිම සිරස්තලයේ යම් ගැටළුවක් තිබේද? එසේත් නැතිනම් කිසිදු ගැටළුවක් නැතිද? එය සැබවින්ම පාඨකයින් විසින් විමසුමට ලක් කළ යුතු කරුණකි.